


# කව්බෝයි ක්‍රිකට් - 3

## සංස්කෘතික පරිහානියේ කැඩපත

දර්ශන මේදිස්

ජාතිකවාදයෙහි ශ්‍රී ලාංකික ප්‍රවර්ගය සිංහල වර්ගවාදය සමග සම්මිශ්‍රිත ය. මෙරට ක්‍රිකට් විශයෙහි පැතිරුනු වර්ගවාදය 1970 දශකය තරම් ඈතට දිව යන බව පෙන්වා දෙනු ලැබ ඇත. එල්. ටී. ටී. ඊ සංවිධානය බිහි වීමටත් පෙර, එංගලන්තයේ ඕවල් පිටියෙහි බෙදාහරින ලද පත්‍රිකවකින් අයැද සිටියේ වර්ගවාදී ශ්‍රී ලංකා ක්‍රිකට් පිල වර්ජනය කරන ලෙස යි (මයිකල් රොබර්ට්ස් හා ඇල්ෆ්‍රඩ් ෙ-මිස්, Crosscurrentso Sri Lanka and Australia at Cricket" Walla Press" Petersham"1998). මේ චෝදනාවෙන් නිදහස් වනු පිනිස දෙමල ජාතික ක්‍රීඩකයෙකු හට ද ඉඳහිට ජාතික කන්ඩායම තුල ඉඩක් ලබා දීමට වර්ගවාදී ධනපති කොලඹ ආන්ඩු වග බලා ගත් අතර මුත්තයියා මුරලිදරන් අඛන්ඩව කුසලතා පෙන්වීම ඔවුන්ට මහත් අස්-වැසිල්ලක් විය.

ජාතිකවාදය, ජාත්‍යන්තර කම්කරු පන්තියෙහි එකමුතුවට බාධාකාරී වන බව ධනේශ්වර ආන්ඩු මැනවින් දනී. ලෝක පරිමානව, ප්‍රාග්ධනයෙහි වහලුන් වන වැටුප් ශ්‍රමිකයන් හට රටක් ජාතියක් නැති වග කම්කරු ව්‍යාපාරයෙහි නායකයෝ එදා සිට ම පෙන්වා දුන්හ. "ජාතිකාභිමානය නමැති දරුනු ශාපයෙන් ඔබ විමුක්තව සිටින වග මා නිරීක්ශනය කලේ බලවත් සන්තුශ්ටියකිනි" යි වරක් එංගල්ස් මාක්ස්ට ලියා යැවී ය.

අනෙක් අතට, ක්‍රිකට් ක්‍රීඩකයන් වෙත එල්ල වන දූශන චෝදනාවන්ගෙන් (match fixing) පැහැදිලි වනුයේ මොවුන්ගේ ජාත්‍යනුරාගය අල්ලසට යට වන බව යි. සමහරුන් වැඩි වාසි ගෙනෙන .ලීග් ක්‍රිකට්. වෙනුවෙන් .ජාතික මෙහෙවර. පාවා දෙන බවට ද මැසිවිලි නැගේ. මේවායෙහි සැබෑ වරදකරු ඒ හෝ මේ ක්‍රීඩකයා නොව ඔවුන් එතැනට ඇද දමන්නා වූ සමාජ ක්‍රමය යි.

### පුද්ගලවාදය

ධනේශ්වර යුගයෙහි දී තියුනු මුහුනුවරක් ගත් පුද්ගලවාදය (individualism) අනෙක් ඕනෑ ම ක්ශේත්‍රයක මෙන් ම ක්‍රීඩා ලෝකය පුරා ද ඔඩු දුවන පිලිලයක්ව තිබේ. ක්‍රිකට් යනු කාන්ඩ ක්‍රීඩාවක් වුව පන්දු යැවීම, පන්දු රැකීම හා පන්දුවට පහර දීම යන අංශත්‍රයෙහි දී ම එය (පුද්ගලවාදය) ක්‍රියාත්මක වනු පෙනේ. ක්‍රීඩකයන්ගේ පෞද්ගලික කුසලතා හෙවත් .ක්‍රිකට් වාර්තා. හුවා දැක්වීම මෙහි පැරනිතම රූපය වන අතර කේවල නිපුනතා මත ක්‍රීඩකයන් ශ්‍රේනිගත කිරීම (ranking / rating ) මෙහි නවතම, වඩාත් අශෝභන අංගය වෙයි. මෙලෙස, ධනපති ජනමාධ්‍ය හා වෙලෙඳ සමාගම් විසින් නන් අයුරින් පුම්බනු ලබන .ක්‍රිකට් තරු. අද්‍යතන සමාජය මත පතුරුවනුයේ සුලුපටු ආනුභාවයක් නොවේ. ක්‍රීඩා ලෝලීහු, විශේශයෙන් ම, බාල හා තරුන පරපුර මේ සේරිවානිජ චරිත පරමාදර්ශ ලෙස සැලකීමට පුරුදුව සිටිත්.

### ක්‍රීඩකත්වය කෙලෙසීම

ඕනෑ ම ක්‍රීඩාවක දී, ක්‍රීඩකයන්ගෙන් අපේක්ශා කෙරෙන එක් වැදගත් ගුනාංගයක් ඇත. ඒ, ක්‍රීඩකත්වය (sportsmanship) යි. 1932-33 වකවානුවෙහි එංගලන්ත පිලෙහි නායකයා විසින් යොදා ගැනුනු කුප්‍රකට ,body line attack, (මේ උපාය පිතිකරුවන්ට අනතුරුදායක විය) බඳු ඇතැම් විරල සිද්ධියක් හැරුනු විට, කලකට පෙර, පොදුවේ ක්‍රිකට් ක්‍රීඩකයන් වෙතින් මෙය නොඅඩුව විද්‍යමාන විය. දැවී ගිය පිතිකරුවෙකු විනිසුරුගේ තීරනයට පෙර ම ක්‍රීඩාගාරය වෙත පිය නැගීම එවක ඉතා සුලභ දසුනකි. එසේ ම, දැවී ගිය බවට තීන්දු කෙරුනු පිතිකරුවන් යලි පිටියට කැඳවීම ද නිතර සිදු විය. එහෙත්, කල් යත් ම, බොහෝ පිතිකරුවන් පෙරලා පැමිනියේ විනිසුරුට රවමිනි. අනෙක් අතට, ජාතිකවාදී විශබීජයෙන් ආසාදිත ඇතැම් විනිසුරන් පක්ශග්‍රාහී තීරන ලබා දුන් අවස්ථා ද ඇත. මේ අයුරින්, කලෙක .මහත්වරුන්ගේ ක්‍රීඩාව. (Gentlemen's game) ලෙස බුහුමන් ලද ක්‍රිකට් .මහත් හොරුන්ගේ ක්‍රීඩාවක්. බවට පෙරලීම නිසා මධ්‍යස්ථ විනිසුරන් මතු නොව කැමරා පුනර්රූපන මත යැපෙන තෙවන විනිසුරෙකු යෙදවීමට ද, ආරාවුල් බේරන තරග තීරකවරුන් පත් කිරීමට ද ජාත්‍යන්තර ක්‍රිකට් සම්මේලනයට සිදු විය. සාමාන්‍යයෙන්, තරග තීරකයන් ලෙස බඳවා ගැනෙනුයේ ක්‍රීඩකත්වය මැනවින් ප්‍රදර්ශනය කල හිටපු ක්‍රිකට් ක්‍රීඩකයන් ය. ඒ සඳහා සුදුස්සන් තේරීම අද කලූනික සෙවීමක් වී ඇත.

සියලු මානුශික සබඳතා හුදෙක් ද්‍රව්‍යමය ගනුදෙනු බවට ඌනනය කෙරුනු සමාජයක ක්‍රීඩාවෙහි ආචාර ධර්ම පමනක් නොනැසී ඉතිරි විය හැකි ද? 1999 ලෝක කුසලාන තරගාවලියෙහි දී, ලකුනු අසූවක් ලබා සිටි පාක-ිස්ථානු පිතිකරු පාදයෙහි ආබාධයකින් බිම වැතිර ගත් කල්හි ඕස්ට්‍රේලියානු පන්දු රකින්නන් ඔහු දුවද්දී දවා ගැනුමට හසු කර ගත් අශෝභන ලීලාව මත් ක්‍රීඩාවෙහි වත්මන් ස්වභාවය මොනවට කියාපායි. මෑත ඉතිහා-සයෙහි, අභ්‍යන්තර මතභේද හා පුද්ගල ගැටුම් උද්ගත නොවූ එක ද ජාතික ක්‍රිකට් පිලක් වත් නොමැත. ක්‍රීඩාව ජීවනෝපායයක් වීමෙහි ප්‍රතිඵල එබඳු ය. වර්තමානයෙහි, නිල ක්‍රීඩාව මත් සූදු කෙලියකි. ඇතැමෙකුට එය ලොතරැයි දිනුමකි. තරගාවලියෙහි වීරයාට පිදෙන සුඛෝපභෝගී රථයෙන් එය සංකේතවත් වෙයි. මෙකල ටෙස්ට් ක්‍රිකට් වුව තනිකර වෙලෙඳ ව්‍යාපාරයකි. එහි පැවති අතරමැද විවේක දිනය පවා ක්‍රීඩකයන්ගෙන් උදුරාගනු ලැබ ඇත.

ආයෝජකයන්ගේ නවතම ජාවාරම හෙවත් ඉන්දියන් ප්‍රෙමියර් ලීග් කුසලාන තරගාවලිය (IPL Trophy) 18වෙනි සියවසෙහි වහල් වෙලෙඳාම සිහියට නංවයි. වෙනසකට ඇත්තේ එදා වහලාට හෝ වහලියට කිසිදු පෞද්ගලික ප්‍රතිලාභයක් හිමි නොවීම යි. මෙකී තරගාවලිය සඳහා ක්‍රීඩකයන් හට ලන්සු තැබෙනුයේ ඩොලර් මිලියන ගනනිනි. 2008 දී ඇරැඹුනු ප්‍රථම වෙන්දේසියෙහි දී ම ක්‍රීඩකයන් 75ක් ඩොලර් 36,780,000 මුදලකට අලෙවි වූ අතර එක් ක්‍රීඩකයෙකුගේ සාමාන්‍ය වටිනාකම ඩොලර් පන් ලක්ශයක් පමන විය.

ක්‍රිකට් ක්‍රීඩාවෙහි මේ දැවැන්ත පරිහානිය ධනේශ්වර සංස්කෘතියෙහි ශීඝ්‍ර කුනු වීමට අනුරූප වෙයි. එදා පැවති සම්භාවනීය ක්‍රීඩාවත් මෙදා .කව්බෝයි. ක්‍රීඩාවත් අතර පවතිනුයේ ප්‍රගාඪ පරතරයකි. ධනවාදය තම අවධිය තුල පරිපාකයට පත් වාද්‍ය සංගීතය තමන් යටතේ ම පරිහානියට ගොදුරු කලේ යම් සේ ද, එසේ ම, එය තමන් විසින් පෝශනය කෙරුනු ක්‍රිකට් ක්‍රීඩාව තමන් අතින් ම දූශනය කරනු ලැබ තිබේ.

ලිපිය ආරම්භයෙහි දී මා සඳහන් කල ඒ අපූරු කෘතියෙහි කතුවරයා තවමත් ජීවතුන් අතර නම්, තමාගේ මීලග පොතට මෙලෙස නම් තබනු සිකුරු යද
"Cricket Ugly Cricket"

*(සත්වෙනි ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය නිමිති කොට ගෙන කම්කරු මාවත පුවත්පතට (1999 ජූනි 25 / ජූලි 09 කලාප) මවිසින් ලියන ලද "ක්‍රිකට් ක්‍රීඩාවේ අවගමනයද වානිජකරනය, ජාත්‍යනුරාගය හා පුද්ගලවාදය" නමැති ලිපියෙන් ඇතැම් කරුනු මෙහිලා යලි උපුටා ගැනින.)*

